www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව කොළඹ මැතිවරනයට තරග වදී

## Sri Lankan SEP stands in Colombo election against war and social inequality

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2009 මාර්තු 09**

අප්‍රේල් මස 25 දිනට නියමිතව ඇති බස්නාහිර පලාත් සභා මැතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂය (සසප) කොළඹ දිස්ත්‍රික්කයට තරග වදියි. පසුගිය මාසයේ පැවති මධ්‍යම හා වයඹ පලාත් සභා මැතිවරනවල දී මෙන්ම මෙවරත්, ආන්ඩුවේ වර්ගවාදී යුද්ධය ද ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන් ද සමාජ අසමානතාව ද අවසන් කිරීමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් සටන් වදින්නේ එහි අපේක්ෂකයන් පමනි.

සසප ඉදිරිපත් කරන අපේක්ෂකයන්ට වතු හා කාර්මික කම්කරුවන්, ගුරුවරු, බැංකු කම්කරුවන්, ධීවරයන්, ගෘහනීන්, ශිෂ්‍යයන් හා නීතිඥයෝ ද ඇතුලත් වෙති. සසප දේශපාලන කමිටුවේ සාමාජික විලානි පීරිස් කන්ඩායමේ නායකත්වය දරන්නීය. 1969 වසරේ ඇයට වයස 21ක්ව සිටිය දී, සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට (විකොස) බැඳුනු ඇය, සමාජවාදය සඳහා අරගලය තුලින් කම්කරු පන්තියේ අවශ්‍යතා ආරක්ෂා කිරීම වෙනුවෙන් සිය මුලු වැඩිහිටි ජීවිතයම කැපකර ඇත.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිවරනය කැඳවා ඇත්තේ, එල්ටීටීඊයට එරෙහිව හමුදාව අත්කරගත් ජයග්‍රහනවලින් පසුව උසිගන්වාගෙන ඇති ප්‍රතිගාමී විජයග්‍රහනයේ වාතාවරනය ගසාකෑමේ බලාපොරොත්තුව ඇතිවය. රාජපක්ෂ කියාපාන්නේ පසුගිය මාසයේ මැතිවරනය තුල පක්ෂය ලැබූ ජයග්‍රහනයෙන්, යුද්ධය කෙරෙහි ඡන්දදායකයන්ගේ සහයෝගය ප්‍රදර්ශනය කරන බවය. ඊට පටහැනි ලෙස පෙන්නුම්කර ඇත්තේ, ආන්ඩුවේ යුද්ධය පිටුපස ගාල්වී සිටින ප්‍රධාන විරුද්ධ පක්ෂ වෙතින් කිසිදු අභියෝගයක් ආන්ඩුවට එරෙහිව එල්ල නොවීමේ කාරනයයි.

උතුරේ මුලතිව් දිස්ත්‍රික්කය තුල සිදුවෙමින් ඇති යුද අපරාධ වෙනුවෙන් කොළඹ සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතයම වගකීම දරා සිටියි. මිලිටරිය විසින් ඉව බව නැතිව සිදුකරන ෂෙල් වෙඩි ප්‍රහාර හා බෝම්බ හෙලීමෙන් දෙමල වැසියන් සිය ගනනක් මරනයට පත්ව හා දහස් ගනනක් තුවාල ලබා ඇත. යුද කලාපයෙන් පලායන වැසියෝ, ආරක්ෂක හමුදාවන් විසින් කටුකම්බි වැටවලින් කොටුකල රැඳවුම් කඳවුරු තුලට ගාල්කරනු ලැබ තිබේ.

දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදාව වහාම හා කොන්දේසි විරහිතව ඉවත්කල යුතු යයි සසප, ඉල්ලා සිටියි. එහි අරමුන, දෙමල ජනතාවට මාරක දේශපාලන උගුලක් බවට පත්ව තිබෙන බව සනාථ වී ඇති එල්ටීටීඊයේ බෙදුම්වාදී වැඩපිලිවෙලට පිටුබලය සැපයීම නොව, වැඩකරන ජනතාව එහි පොදු පන්ති සතුරා වන කොළඹ ආන්ඩුවට හා එය ආරක්ෂා කරන ධනේශ්වර පර්යායට එරෙහිව ප්‍රබල එකමුතුවකට ගෙන ඒමයි.

එල්ටීටීඊයට එරෙහි හමුදා ජයග්‍රහනවලට සමාන්තරව, සේවා තත්වයන්, වැටුප්, රැකියා හා අත්‍යවශ්‍ය සේවාවන්ට එරෙහිව එල්ලකෙරෙන ප්‍රහාර ද වඩ වඩාත් උග්‍ර කෙරෙනු ඇතැයි සසප අනතුරු අඟවා සිටියි. ජනාධිපති රාජපක්ෂ ඔහුගේ යුද්ධයට ගෙවීම සඳහා රට උකස්කර ඇතුවා පමනක් නොව, 1930 ගනන්වලින් පසුව එලඹී ඇති උග්‍ර ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ තවත් මුදල් ඉල්ලා හිඟමනේ යමින් සිටියි. යුද්ධය සඳහා කැපකරන ලෙසට වැඩකරන ජනතාවට බලකෙරුනු ආකාරයටම දැන් ''ජාතිය ගොඩනැඟීම සඳහා කැප කරන'' ලෙස අනිවාර්යෙන්ම ඔවුන්ට කියා සිටිනු ඇත.

විදේශ සංචිත 2008 ජූලි මාසයේ තිබූ එ.ජ. ඩොලර් බිලියන 3.56 සිට දෙසැම්බර් වන විට බිලියන 1.75 දක්වා සිදී ඇත. එය සැහෙන්නේ මාස එක හමාරක ආනයන සඳහා ගෙවීමට පමනි. ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපොලෙන් නය ගැනීමට නොහැකි වූ තතු හමුවේ මහ බැංකුවට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) වෙත හැරීමට සිදුව තිබේ. ජාමූඅ මාර්තු මස 2 දින ශ්‍රී ලංකාවේ අඩමාන තත්වය විස්තර කලේ ''දශකයක් තුල මුහුනපා ඇති දරුනුම ගෙවුම්ශේෂ හිඟය'' ලෙසය. ජාමූඅ නය ලැබෙන්නේ ඊට ඇමිනූ කොන්දේසි ද සහිතවය. ඊට තවදුර පුද්ගලීකරනය හා සමාජ වියදම් ගැඹුරටම කපාහැරීම පිලිබඳ නිර්දේශ ද ඇතුලත් වනු ඇත.

ආන්ඩුව, සමාජ අසහනයෙන් නැගෙන තර්ජන විස්තර කිරීම සඳහා, දැනටමත් මිලිටරිමය භාෂාව යොදාගනිමින් සිටියි. කලාපීය සහයෝගීතාව සඳහා

වන දකුනු ආසියානු සමුලුව (සාර්ක්) අමතා පෙබරවාරි 25 දා ජනාධිපති රාජපක්ෂ මෙසේ පැවසීය. ''මෙම (ගෝලීය ආර්ථික) අර්බුදය මඟින් නිර්මානය කර ඇති අස්ථාවරත්වය, සැබවින්ම අපගේ සමාජයන්ට ත්‍රස්තවාදයෙන් එල්ලවී තිබෙන තර්ජනයට හරියටම සමාන යයි සැලකිය හැකිය.''

පසුගිය දෙවසර පුරා රාජපක්ෂ, වැඩ වර්ජක කම්කරුවන්ට මෙන්ම විරෝධතාවන්හි නිරතවූ ගොවීන්ට හා ශිෂ්‍යයන්ට විරුද්ධව, ඔවුන් ''කොටි ත්‍රස්තවාදින්ගේ ආධාරකරුවන්'' ය යන චෝදනාව යලියලිත් එල්ල කලේය. එනම්. ඔවුන් ආර්ථික කඩාකප්පල්කාරීන් වන බවය. යුද්ධය පැවති 25 වසර පුරා ගොඩනඟන ලද දැවැන්ත ආරක්ෂක යාන්ත්‍රනය හා ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති සමුදාය දැනටමත් කම්කරු පන්තියට එරෙහිව හරවා අවසානය. ජාමූඅ හා මහ බැංකුව නය මුදලක් පිලිබඳ කොන්දේසි සාකච්ඡා කරමින් සිටි මාර්තු 3 දින, ආන්ඩුව, ඒවන විටත් බොහෝ ප්‍රමාද වී තිබුනු විදුලි බලය පුද්ගලීකරනය සඳහා වේදිකාව සකසන පනත, පාර්ලිමේන්තුව තුලින් සම්මත කර ගත්තේය. එදිනම පනතට විරෝධය පෑ සිය ගනනක් කම්කරුවන් වැටලූ 600කින් සමන්විත පොලිස් භටයෝ. කම්කරුවන් විදුලිබල මන්ඩල මූලස්ථානය වෙත ගමන්කිරීමට උත්සාහ කල හොත් යුදකාලීන හදිසි නීති බලතල ක්‍රියාත්මක කරන බවට තර්ජනය කලහ.

විශ්වවිද්‍යාල සිසුන් ද ඉලක්ක බවට පත්ව තිබේ. විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ප්‍රචන්ඩ ක්‍රියා නතරකිරීමේ මුවාවෙන් කැලනිය විශ්වවිද්‍යාලය වසා දමා විරෝධතාවයේ යෙදුනු සිසුන්ට චෝදනා කර ඔවුන් අත් අඩංගුවට ගැනීම සඳහා ආන්ඩුව පිටුබලය ලබා දුන්නේය. ''විශ්වවිද්‍යාල ත්‍රස්තවාදීන් විරේක කර දැමීමට'' පොලිසිය යොදාගන්නා ලෙස ඉල්ලමින් අයිලන්ඩ් පුවත්පත මෙසේ ප්‍රකාශ කලේය. ''දින ගනනක් තුල උතුර ත්‍රස්තවාදයෙන් නිදහස් කරගනු ඇත. රටේ එම කොටසෙහි යුද්ධය අවසන් වීමෙන් පසුව, ආන්ඩුව සිය මුලු ශක්තියම යොදා උසස් අධ්‍යාපන ආයතන මුදාගැනීම සඳහා යා යුතුව ඇත.''

සියලුම ප්‍රධාන පක්ෂ රාජපක්ෂගේ ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට'' පිටුබලය දී ඇති අතර කම්කරු පන්තියට එරෙහි ඔහුගේ කඩාපැනීම්වලදීත් එයම කරනු ඇත.

එක්සත් ජාතික පක්ෂය (එජාප) දැන් 2002 සටන් විරාමය හා ඉන්පසු එල්ටීටීඊ සමග ගෙනගිය සාම සාකච්ඡා මුලුමනින්ම අතහැර දමා ඇත. එජාප නායක රනිල් වික්‍රමසිංහ සිය මුලු වැර යොදා රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයට පිටුබලය සපයා ඇති අතර, රාජපක්ෂ මෙන්ම, අනෙකුත් ''ත්‍රස්තවාදී'' තර්ජනවලට මුහුන දීම සඳහා රාජ්‍යය ශක්තිමත් කල යුතු යයි, ඉල්ලා සිටියි. එජාපයේ උත්සුකය වූයේ යුද්ධයෙන් ව්‍යාපාරවලට ඇතිවන බලපෑම පිලිබඳව මිස කිසි විටෙකත් සාමාන්‍ය වැඩකරන ජනතාවගේ ජීවිත හා ජීවන අපේක්ෂාවන් පිලිබඳව නොවේ. එයට අවශ්‍ය වූයේ විදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස දිවයින විවෘතකර ගැනීමෙහිලා ඉවහල් වන බලය බෙදීමේ වැඩපිලිවෙලකි.

ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), මුල පටන්ම යුද්ධය යලි ඇරඹීමට තල්ලුව දුන් අතර කම්කරු පන්තියේ අරගල කඩාකප්පල්කිරීමෙහි ලා තීරනාත්මක භූමිකාවක් ඉටු කර ඇත. ඔවුන්ගේ සියලු සටන්කාමී කටහැකරකම් තිබියදීම ජවිපෙ වෘත්තීය සමිති නායකයන්, කම්කරුවන්ගේ අවශ්‍යතාවන්ට වඩා යුද අරමුනු මුල් තැන ගන්නා බවට ආන්ඩුව කල සෑම බලපෑමක් හමුවේම හිස නමාගෙන තිබේ. විදුලිබලය පුද්ගලීකරනයට එරෙහි ජවිපෙ විරෝධය පදනම්ව ඇති ජාතික සම්පත් රැකගැනීමේ ''දේශප්‍රේමීත්වය'' වනාහි, ලොව පුරාම කම්කරුවන් ධනපති පන්තියට හා ජාතික රාජ්‍යයට යටත්කිරීම් වස් උසිගන්වා ඇති එම ප්‍රතිගාමී ආර්ථික ජාතිකවාදයම වේ.

මැතිවරනයට ඉදිරිපත්ව සිටින නව සමසමාජ පක්ෂයේ (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂයේ (එසප) සමාජවාදී මවාපෑම ද කම්කරුවන් හා තරුනයන් විසින් එලෙසම ප්‍රතික්ෂේප කල යුතුය. මෙම දෙපක්ෂයේම උත්සාහය වී ඇත්තේ නිල දේශපාලනයේ වාර්ගික ආකෘතියට හා ධනේශ්වර පක්ෂවලට කම්කරු පන්තිය යටත් කිරීමයි. මෙම මැතිවරනයේ දී ඔවුහු, විශේෂයෙන්ම සිංහල වැඩකරන ජනතාව අතර, දැනට අභාවයට පත්ව ඇති ජාත්‍යන්තර සාම සාකච්ඡාවලට යලි එලඹෙන්නැයි කැඳවුම් කිරීම සඳහා දක්ෂිනාංශික එජාපය පොලඹවා ගත හැකිය යන මිත්‍යාව තොරොම්බල් කරති.

දෙමල ජනතාව අතර දී නසසප හා එසප, ''දෙමල ජනතාවගේ එකම නියෝජිතයා'' තමන්ය යන එල්ටීටීඊයේ ව්‍යාජ කියාපෑම් හුවා දක්වති. සැබවින්ම එල්ටීටීඊය නියෝජනය කරන්නේ කම්කරු පන්තියේ නොව දෙමල ධනේශ්වරයේ අවශ්‍යතාවන්ය. ඕනෑම දේශපාලන විවේචනයක් රුදුරු ලෙස මැඩීමත්, එහි බලහත්කාරී බඳවාගැනීම් හා දැන් උතුරු යුද කලාපය හැර යාමට සිවිල් වැසියන්ට ඉඩ නොදීමත් මගින් යලි යලිත් පෙන්නුම්කර ඇත්තේ, කම්කරු පන්තිය කෙරෙහි ඇති එහි විරුද්ධත්වයයි. ආන්ඩුවේ සිංහල අධිපතිවාදය මෙන්ම එල්ටීටීඊ දෙමල බෙදුම්වාදයත් සේවය කරන්නේ, වැඩකරන ජනතාව ඔවුන්ගේම ධනේශ්වරයට ගැටගැසීමටත්, ශ්‍රී ලංකාව තුල හා ලොව පුරාත් සිටින ඔවුන්ගේ පන්ති සහෝදර සහෝදරියන්ට එරෙහිව පිහිටුවීමටත් පමනි.

සාම සාකච්ඡා සම්බන්ධයෙන් ගත් කල එය සෑම කල්හිම ප්‍රෝඩාවක් විය. එජාපය මෙන්ම ප්‍රධාන හා අප්‍රධාන බලවතුන් ද ඊට සහයෝගය දැක්වූයේ යුද්ධයෙන් දකුනු ආසියාව අස්ථාවරභාවයට පත්වීමෙන් සිය අවශ්‍යතාවන්ට එල්ලවන තර්ජනය පිටුදැකීමේ විධික්‍රමයක් ලෙස පමනි. ''සාම ක්‍රියාවලිය'' බිඳවැටීමෙන් පසුව එක්සත් ජනපදය, ඉන්දියාව හා අවශේෂ ''ජාත්‍යන්තර ප්‍රජාව'' දේශපාලනිකව මෙන්ම මිලිටරිමය වශයෙන් ද යුද්ධය යලි ඇරඹීමට සිය පිටුබලය ලබාදුන්හ. එල්ටීටීඊය මිලිටරි වශයෙන් බිඳවැටීමට ආසන්නව තිබිය දී දැන් ඔවුන් උකුස්සන් මෙන් දිවයින වටා කරක් ගසන්නේ, ව්‍යසනය ගසාකෑම මගින් ශ්‍රී ලංකාව තුලත් කලාපයේත් තමන්ගේම ආර්ථික හා මූලෝපායික තත්වය වර්ධනය කරගැනීමේ අදිටනින් ය.

රාජපක්ෂ ආන්ඩුව මෙම පලාත්සභා මැතිවරනය යොදාගන්නේ එලඹෙන පන්ති සටන් සඳහා සූදානම්වීමේ දී සිය බලයේ ග්‍රහනය ශක්තිමත් කර ගැනීමටය. කම්කරුවන් හා තරුනයන් පසුගිය 25 වසරේ අත්‍යවශ්‍ය දේශපාලන පාඩම් උකහාගනිමින් හා තමන්ගේම ස්වාධීන පන්ති අවශ්‍යතාවන් ආරක්ෂාකර ගැනීමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කරමින්, තමන්ගේම සූදානම ඇතිකරගත යුතුය. වඩාත් වැදගත් වන්නේ කම්කරු පන්තිය සියලු වර්ගයේ ජාතිවාදයන් හා වර්ගවාදයන් ප්‍රතික්ෂේප කිරීම ය. ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ හා පීඩිත ජනතාවගේ අව්‍යාජ මිතුරන් වන්නේ සිංහල හා දෙමල ධනේශ්වරයේ විවිධ පසමිතුරු කොටස් නොව දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව විසිර සිටින කම්කරුවන්ය.

මැතිවරන ව්‍යාපාරය තුල දී සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂකයෝ සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා, කර්මාන්ත හා කාර්යාල කම්කරුවන්, නාගරික දුගීන්, සිසුන් හා තරුනයන් අතර හැකිතාක් පුලුල් උද්ඝෝෂනයක් දියත් කරනු ඇත. ශ්‍රී ලංකා හා ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන් වැදිය හැක්කේ දකුනු ආසියාවේ හා ලෝකයේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා කම්කරු පන්තිය විසින් පුලුල් පරිමානයෙන් ගෙනයන දේශපාලන අරගලයක කොටසක් ලෙස පමනක් බව අපගේ අපේක්ෂකයෝ පැහැදිලි කර දෙනු ඇත.

අපගේ ක්‍රියාමාර්ගයට සහයෝගය දක්වන සියල්ලන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, පක්ෂ අරමුදලට ආධාර කරමින් ද අපගේ ප්‍රසිද්ධ රැස්වීම්වලට සහභාගී වෙමින් ද අපගේ මැතිවරන උද්ඝෝෂන සාහිත්‍ය බෙදාහැරීමට උදව්කරමින් ද හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂයට බැඳීමට අයැදුම් කරමින් ද සසප උද්ඝෝෂනයට ක්‍රියාශීලීව සහභාගීවන ලෙසයි. දුරකථන අංක 2712104න් (ශ්‍රී ලංකාව) හෝ wswscmb@sltnet.lk යන ඊමේල් ලිපිනයෙන් සසප අමතන්න.